# 2022.07.12 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ නව සභා රැස්වීම් ශාලාවේදී පැවති හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව

**පැමිණීම**

| | | |
|---|---|---|
| 1. බී. කන්දසාමි මහතා | - | ගරු සභාපති |
| 2. වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. එස්. සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. කේ.එම්. විමලසිරි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 6. සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 8. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 9. කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 12. එෆ්. වයලට් රෝස් මහත්මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 13. ගෝපාලන් මුරුගන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14. තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 15. ආර්.එම්. අනුලාවතී මල්ලිකා මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 16. එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 17. වේලුසාමි එලිල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී |
| 18. ආර්.එල්.සුදර්ශන මහතා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

## 01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.06.09 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. එම්.විමලසිරි මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**නැත**

## 03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන

**නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

පැරණි පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට අදාලව කඩා ඉවත් කළ ද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එකී ද්‍රව්‍ය වෙන්දේසි කිරීම සුදුසු බවත්, ඒ සඳහා පහත සඳහන් සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

1. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ෂණ නිලධාරි
2. ප්‍රධාන  කළමනාකරණ සේවා නිලධාරි
3. කාර්මික නිලධාරි
4. මන්ත්‍රී මණ්ඩලය නියෝජනය 01
5. ගබඩා විෂය භාර නිලධාරි

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.සී.කිත්සිරි පෙරේරා මහතා

විවාද

පැරණි පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට අදාලව කඩා ඉවත් කළ ද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එකී ද්‍රව්‍ය වෙන්දේසි කිරීම සුදුසු බවත්, ඒ සඳහා පහත සඳහන් සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

1. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ෂණ නිලධාරි
2. ප්‍රධාන  කළමනාකරණ සේවා නිලධාරි
3. කාර්මික නිලධාරි
4. මන්ත්‍රී මණ්ඩලය නියෝජනය 01
5. ගබඩා විෂය භාර නිලධාරි

ඉහත සමීක්ෂණ මණ්ඩලය නියෝජනය කරනු ලබන මන්ත්‍රී නියෝජනය සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.සී.කිත්සිරි පෙරේරා මහතා සුදුසු බවට ගරු උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා විසින් යෝජනා සිදු කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර කුලී පදනම මත ලබා දීම මත ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර කුලී පදනම මත ලබා දීම මත ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ගරු මූලාසනය විසින් කරුණු පැහැදිලි කරන ලද අතර කෙටුම්පත් මණ්ඩලය විසින් කෙටුම්පත් කරන ලද අතුරු ව්‍යවස්ථාව සභාවේ සියලු දෙනා වෙත කියවා පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කමිටුවේ සාමාජිකයෙකු ලෙස මහා සභාව නියෝජනය කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.අයි.රාමනායක මහතාගේ සාමාජිකත්වය සහිතව නැවත මෙම කෙටුම්පත කමිටුවේ සාකච්ඡාවට භාජනය කිරීමෙන් අනතුරුව ඊළඟ මස මහා සභාවට යොමු කර සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එකී යෝජනාව සදහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලදී.

ඒ අනුව ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් එකී අතුරු ව්‍යවස්ථාව සංශෝධන නිවැරදි කර ලබන මස මහ සභා වාරයට ඉදිරිපත් කිරීම සුදුසු බවට අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 03

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව සතු බැකෝ යන්ත්‍රය සඳහා ගාස්තු ලෙස යන්ත්‍ර පැයක් සඳහා මේ වන තෙක් අය කරන ලද රු.2,500.00ක මුදල වර්තමාන වෙළඳපොළ මිල ගණන් සළකා බලා කාර්මික නිලධාරී ඇස්තමේන්තු ප්‍රකාරව ඉන්ධන සහිතව රු.6250.00ක් ලෙසත් ඉන්ධන රහිතව රු.2500.00ක මුදලක් ලෙසත් සංශෝධනය කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව සතු බැකෝ යන්ත්‍රය සඳහා ගාස්තු ලෙස යන්ත්‍ර පැයක් සඳහා මේ වන තෙක් අය කරන ලද රු.2,500.00ක මුදල වර්තමාන වෙළඳපොළ මිල ගණන් සළකා බලා කාර්මික නිලධාරී ඇස්තමේන්තු ප්‍රකාරව ඉන්ධන සහිතව රු.6250.00ක් ලෙසත් ඉන්ධන රහිතව රු.2500.00ක මුදලක් ලෙසත් සංශෝධනය කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම.

යෝජනාව - ගරු සභාපති බී. කන්දසාමි මහතා
ස්ථිර කිරීම - ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

කාරක සභාව මහ සභාව සභාවක් බවට පත් කිරීම.

යෝජනාව - ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා
ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා

ඒ අනුව මෙම මිල ගණන් සකස් කර ඇති ආකාරය පිළිබදව පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

නාගරික සංවර්ධන අධිකාරිය විසින් යොමු කර ඇති 2022-05-26 දිනැති DDG/P2/PC/LA ලිපිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා සඳහා වූ සැලසුම් කමිටු දීමනාව රු.2000.00 ලෙස සංශෝධනය කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා</u>

<u>විවාද</u>

නාගරික සංවර්ධන අධිකාරිය විසින් යොමු කර ඇති 2022-05-26 දිනැති DDG/P2/PC/LA ලිපිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා සඳහා වූ සැලසුම් කමිටු දීමනාව රු.2000.00 ලෙස සංශෝධනය කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

වර්තමානයේ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් නගරයට වාහන නොපැමිණීම නිසා 2022.06.30 - 2022.07.01 වන දින දක්වා පොළ බදු හා වාහන බදු අය කිරීමට අපහසු වූ බැවින් සහනයක් ලබා දෙන ලෙසත් ගිවිසුම් ගත දෛනික කුලී මුදල වන රු.2070.00ක මුදල සඳහා ඉන්ධන හිඟය සමනය වන තුරු සහනයක් ලබා දෙන ලෙසට හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොළ බදු හා වාහන බදු ටෙන්ඩර්කරු වන හපුතලේ , පංකැටිය වත්ත , ලිපිනයේ පදිංචි කේ. ශාන්ත කුමාර් මහතා විසින් සිදු කර ඇති ඉල්ලීම් ලිපිය ප්‍රකාරව එකී දින දෙකෙ හි ආදායම් ඉපයීමට නොහැකි වීම නිසා එම දින දෙක සඳහා කුලී මුදල් අය නොකිරීම සුදුසු බව තීරණය කරන ලද අතර වර්තමානයේ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් ඉදිරියේදී දෛනික කුලී මුදලින් 25 % ක ප්‍රතිශතයක් අඩු කර කුලී මුදල් රැස් කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ

සභාවට යොමු කර පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ අනුමැතියට යටත්ව අදාළ තීරණ ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි. එම්. නිමල් අමරසිරි මහතා

විවාද

වර්තමානයේ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් නගරයට වාහන නොපැමිණීම නිසා 2022.06.30 - 2022.07.01 වන දින දක්වා පොළ බදු හා වාහන බදු අය නොකිරීමත් ගිවිසුම් ගත දෛනික කුලී මුදල වන රු.2070.00ක මුදල සඳහා ඉන්ධන හිඟය සමනය වන තුරු සහනයක් ලබා දෙන ලෙසට හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොළ බදු හා වාහන බදු ටෙන්ඩර්කරු වන හපුතලේ , පංකැටිය වත්ත , ලිපිනයේ පදිංචි කේ. ශාන්ත කුමාර් මහතා විසින් සිදු කර ඇති ඉල්ලීම් ලිපිය ප්‍රකාරව එකී දින දෙකෙ හි ආදායම් ඉපයීමට නොහැකි වීම නිසා එම දින දෙක සඳහා කුලී මුදල් අය නොකිරීම සුදුසු බව තීරණය කරන ලද අතර වර්තමානයේ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් ඉදිරියේදී දෛනික කුලී මුදලින් 25 % ක ප්‍රතිශතයක් අඩු කර කුලී මුදල් රැස් කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කර පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ අනුමැතියට යටත්ව අදාළ තීරණ ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

රට තුළ පවතින ඉන්ධන අර්බුදය මත අප ආයතනය විසින් ඉන්ධන ලබා ගනු ලබන දියතලාව වෙලින්ටන් ෆුවෙල් ඉන්ධන පිරවුම්හලේ 2022 ජූනි මස 23 දිනෙන් පසුව ඉන්ධන නිකුත් කිරීමක් සිදු නොකරන හෙයින් හපුතලේ ප්‍රාදේශීය සභාව මගින් සිදු කරනු ලබන අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කිරීමට පහත අංක දරණ වාහන සඳහා බණ්ඩාරවෙල ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් අත්පිට මුදලට ඉන්ධන ලබා ගත යුතු හෙයින් ඒ සඳහා රු.100,000.00ක උපරිමයකට යටත්ව අත්තිකාරමක් ලබා ගෙන ඉන්ධන ලබා ගැනීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

| අනු අංකය | වාහන අංකය | වාහනය | සපයනු ලබන ඉන්ධන ප්‍රමාණය (ලීටර්) |
|---|---|---|---|
| 1 | PF 5496 | සභාපතිතුමන්ගේ නිල කැබ් රථය | 60 |
| 2 | LL7477 | කaa කැබ් රථය | 40 |
| 3 | ZB0405 | කම්පැක්ටර් රථය | 50 |

| | | | |
|---|---|---|---|
| 4 | RD6209 | ට්‍රැක්ටරය | 30 |
| 5 | JW6588 | ට්‍රැක්ටරය | 30 |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ. එම්. සීගිරි ලංකා ඒකනායක මහතා

විවාද

රට තුළ පවතින ඉන්ධන අර්බුදය මත අප ආයතනය විසින් ඉන්ධන ලබා ගනු ලබන දියතලාව වෙලින්ටන් ඉවෙල් ඉන්ධන පිරවුම්හලේ 2022 ජූනි මස 23 දිනෙන් පසුව ඉන්ධන නිකුත් කිරීමක් සිදු නොකරන හෙයින් හපුතලේ ප්‍රාදේශීය සභාව මගින් සිදු කරනු ලබන අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කිරීමට පහත අංක දරණ වාහන සඳහා බණ්ඩාරවෙල ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් අත්පිට මුදලට ඉන්ධන ලබා ගත යුතු හෙයින් ඒ සඳහා රු.100,000.00ක උපරිමයකට යටත්ව අත්තිකාරමක් ලබා ගෙන ඉන්ධන ලබා ගැනීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| අනු අංකය | වාහන අංකය | වාහනය | සපයනු ලබන ඉන්ධන ප්‍රමාණය (ලීටර්) |
|---|---|---|---|
| 1 | PF 5496 | සභාපතිතුමන්ගේ නිල කැබ් රථය | 60 |
| 2 | LL7477 | කෘෂි කැබ් රථය | 40 |
| 3 | ZB0405 | කම්පැක්ටර් රථය | 50 |
| 4 | RD6209 | ට්‍රැක්ටරය | 30 |
| 5 | JW6588 | ට්‍රැක්ටරය | 30 |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ පැරණි බහු කාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම හා වැසිකිළි පද්ධතිය ඉදි කිරීම සඳහා බිම් සැකසීමේ දී එකී භූමියේ පැවති අඹ ගස හා මැයි මාර ගස කපා ඉවත් කළ හෙයින් එකී ගස් වල පැවති දර කාර්මික නිලධාරි තක්සේරු මුදල වන දර යාරයක් සඳහා අවම ගාස්තු වන රු.2300.00 *4 = රු. 9200.00 ක මුදලකට යටත්ව වෙන්දේසි කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා
විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවේ පැරණි බහු කාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම හා වැසිකිළි පද්ධතිය ඉදි කිරීම සඳහා බිම් සැකසීමේ දී එකී භූමියේ පැවති අඹ ගස හා මැයි මාර ගස කපා ඉවත් කළ හෙයින් එකී ගස් වල පැවති දර කාර්මික නිලධාරි තක්සේරු මුදල වන දර යාරයක් සඳහා අවම ගාස්තු වන රු.2300.00 *4 = රු. 9200.00 ක මුදලකට යටත්ව වෙන්දේසි කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

පළාත් පාලන ආයතනයක ප්‍රමුඛතම කාර්යය වන කසළ කළමණාකරණ කටයුතු විධිමත්ව සිදු කිරීම සඳහා කටයුතු කළ යුතු අතර 2022 වසරේ අයවැය සැකසීමේ දී පැවති ඉන්ධන ලීටරයක මිලට සාපේක්ෂව මේ වන විට ඉන්ධන ලීටරයක මිල තුන් ගුණයකින් පමණ ඉහළ ගොස් ඇති අතර අයවැය තුළ වෙන් කර ඇති ප්‍රතිපාදන මේ වන විට ඉක්මවා යාමට ආසන්නව වී ඇත. ඒ අනුව මෙම ආයතනයේ 2022 වසර අයවැය තුළ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කර ඇති අනෙකුත් වැය විෂයන් ගේ ප්‍රතිපාදන මාරු කිරීමටත් රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද අංක BD/CBP/01/04/2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛනය ප්‍රකාරව ද හුදෙක් බල ප්‍රදේශයේ සෞඛ්‍ය විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් පහත සඳහන් වැය විෂයන් සඳහා ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන මාරු කර ගැනීමට වීරමොං ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම සඳහා මු.රෙ. 66 අනුව කටයුතු කළ යුතු අතර ඒ සඳහා අයවැය ඇස්තමේන්තු තුළ පවතින පුනරාවර්තන වැය විෂයන් වල ඉතිරිය පමණක් මාරු කිරීමේ හැකියාව මත පහත සඳහන් වැය විෂයන්ගෙන් මාරු කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය. එසේම තව දුරටත් පවත්නා තත්ත්වය යටතේ ඉන්ධන සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේ නම් 103/02, 303/02 ,203/01 යන වැය විෂයයන් සඳහා ප්‍රාග්ධන වැය විෂය වන 309/01 මගින් ප්‍රතිපාදන හුවමාරු කර ගැනීමේ හැකියාව පිළිබඳ ඌව පළාත් පළාත් පාලන කොමසාරිස්තුමන් දැනුවත් කර ලැබෙන උපදෙස් පරිදි කටයුතු කිරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

| අනු අංකය | වැය විෂය | වෙන් කර ඇති මුදල | 2022.6.31 දිනට සත්‍ය වියදම | ඉතිරි මුදල | ප්‍රතිපාදන මාරු කරන වැය විෂය | මාරු කරන මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 103/02-ඉන්ධන ස්නේහක තෙල්(කැබ් රථ) | 800,000.00 | 433,755.00 | 366,245.00 | 305/03-පැවරුම් නියෝග සඳහා මැනුම් ගාස්තු | 300,000.00 |
| 2 | 104/03-කැබ් රථය | 300,000.00 | | | 304/02 බැකෝ | 114,800.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | සඳහා ටයර් බැටරි යෙදීම | | 256,500.00 | 43,500.00 | යන්ත්‍රය අලුත්වැඩියාව | |
| | | | | | 304/04-බැකෝ යන්ත්‍රය ටයර් සවි කිරීම | 97,700.00 |
| 3 | 205/04-සභා ටැක්ටර්වල රක්ෂණ බලපත්‍ර ගාස්තු | 20,000.00 | 495.00 | 19,505.00 | | අවශ්‍ය නැත |
| 4 | 208-සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් | 209,520.00 | 143,654.71 | 65,865.29 | 105/09-පුහුණු වැඩමුළු සඳහා | 30,000.00 |
| 5 | 303/02-බැකෝ යන්ත්‍රය සඳහා ඉන්ධන | 300,000.00 | 165,938.00 | 134,062.00 | 305/03-පැවරුම් නියෝග සඳහා මැනුම් ගාස්තු | 100,000.00 |
| 6 | 305/07-බැකෝ යන්ත්‍රයේ රක්ෂණ බලපත්‍ර ගාස්තු | 200,000.00 | 55,862.85 | 144,137.15 | | අවශ්‍ය නැත |
| 7 | 308-සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් | 36,286.03 | 27,048.50 | 9,237.53 | 105/09-පුහුණු වැඩමුළළු සඳහා | 40,000.00 |
| 8 | 605/04-සංග්‍රහ වියදම් | 150,000.00 | 132,627.00 | 17,373.00 | 203/02-කම්කරු උපකරණ-40000.00 | 100,000.00 |
| | | | | | 203/03-විෂබීජ නාශක-40000.00 | |
| | | | | | 205/08-පර්සර කටයුතු දැනුවත් කිරීම-20000.00 | |
| 9 | 103/01-ලිපි ද්‍රව්‍ය | 500,000.00 | 235,504.00 | 264,496.00 | 305/03-පැවරුම් නියෝග සඳහා මැනුම් ගාස්තු | 100,000.00 |
| 10 | 105/03-කාර්යාල දුරකතන ගාස්තු | 100,000.00 | 80,870.91 | 19,129.09 | 202/01-සුනඛ එන්නත් ගමන් වියදම් | 50,000.00 |
| | | | | | 203/05-සුනඛ කරපටි හා එන්නත් පොත් | 50,000.00 |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.සී.කිත්සිරි පෙරේරා මහතා

විවාද

පළාත් පාලන ආයතනයක ප්‍රමුඛතම කාර්යය වන කසළ කළමණාකරණ කටයුතු විධිමත්ව සිදු කිරීම සඳහා කටයුතු කළ යුතු අතර 2022 වසරේ අයවැය සැකසීමේ දී පැවති ඉන්ධන ලීටරයක මිලට සාපේක්ෂව මේ වන විට ඉන්ධන ලීටරයක මිල තුන් ගුණයකින් පමණ ඉහළ ගොස් ඇති අතර අයවැය තුළ වෙන් කර ඇති ප්‍රතිපාදන මේ වන විට ඉක්මවා යාමට ආසන්නව වී ඇත. ඒ අනුව මෙම ආයතනයේ 2022 වසර අයවැය තුළ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කර ඇති අනෙකුත් වැය විෂයන් ගේ ප්‍රතිපාදන මාරු කිරීමටත් රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද අංක BD/CBP/01/04/2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛනය ප්‍රකාරව ද හුදෙක් බල ප්‍රදේශයේ සෞඛ්‍ය විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් පහත සඳහන් වැය විෂයන් සඳහා ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන මාරු කර ගැනීමට වීරමොං ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම සඳහා මූ.රෙ. 66 අනුව කටයුතු කළ යුතු අතර ඒ සඳහා අයවැය ඇස්තමේන්තු තුළ පවතින පුනරාවර්තන වැය විෂයන් වල ඉතිරිය පමණක් මාරු කිරීමේ හැකියාව මත පහත සඳහන් වැය විෂයයන් මාරු කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කරන ලද අතර එකී තීරණය මහ සභාවට යොමු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය. එසේම තව දුරටත් පවත්නා තත්ත්වය යටතේ ඉන්ධන සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේ නම් 103/02, 303/02 ,203/01 යන වැය විෂයයන් සඳහා ප්‍රාග්ධන වැය විෂය වන 309/01 මගින් ප්‍රතිපාදන හුවමාරු කර ගැනීමේ හැකියාව පිළිබඳ ඌව පළාත් පළාත් පාලන කොමසාරිස්තුමන් දැනුවත් කර ලැබෙන උපදෙස් පරිදි කටයුතු කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| අනු අංකය | වැය විෂය | වෙන් කර ඇති මුදල | 2022.6.31 දිනට සත්‍ය වියදම | ඉතිරි මුදල | ප්‍රතිපාදන මාරු කරන වැය විෂය | මාරු කරන මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 103/02-ඉන්ධන ස්නේහක තෙල්(කැබ් රථ) | 800,000.00 | 433,755.00 | 366,245.00 | 305/03-පැවරුම් නියෝග සඳහා මැනුම් ගාස්තු | 300,000.00 |
| 2 | 104/03-කැබ් රථය සඳහා ටයර් බැටරි යෙදීම | 300,000.00 | 256,500.00 | 43,500.00 | 304/02 බැකෝ යන්ත්‍රය අලුත්වැඩියාව | 114,800.00 |
| | | | | | 304/04-බැකෝ යන්ත්‍රය ටයර් සවි කිරීම | 97,700.00 |
| 3 | 205/04-සභා ටැක්ටර්වල රක්ෂණ | 20,000.00 | 495.00 | 19,505.00 | | අවශ්‍ය නැත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | බලපත්‍ර ගාස්තු | | | | | |
| 4 | 208-සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් | 209,520.00 | 143,654.71 | 65,865.29 | 105/09-පුහුණු වැඩමුළු සඳහා | 30,000.00 |
| 5 | 303/02-බැකෝ යන්ත්‍රය සඳහා ඉන්ධන | 300,000.00 | 165,938.00 | 134,062.00 | 305/03-පැවරුම් නියෝග සඳහා මැනුම් ගාස්තු | 100,000.00 |
| 6 | 305/07-බැකෝ යන්ත්‍රයේ රක්ෂණ බලපත්‍ර ගාස්තු | 200,000.00 | 55,862.85 | 144,137.15 | | අවශ්‍ය නැත |
| 7 | 308-සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් | 36,286.03 | 27,048.50 | 9,237.53 | 105/09-පුහුණු වැඩමුළු සඳහා | 40,000.00 |
| 8 | 605/04-සංග්‍රහ වියදම් | 150,000.00 | 132,627.00 | 17,373.00 | 203/02-කම්කරු උපකරණ-40000.00 | 100,000.00 |
| | | | | | 203/03-විෂබීජ නාශක-40000.00 | |
| | | | | | 205/08-පරිසර කටයුතු දැනුවත් කිරීම-20000.00 | |
| 9 | 103/01-ලිපි ද්‍රව්‍ය | 500,000.00 | 235,504.00 | 264,496.00 | 305/03-පැවරුම් නියෝග සඳහා මැනුම් ගාස්තු | 100,000.00 |
| 10 | 105/03-කාර්යාල දුරකතන ගාස්තු | 100,000.00 | 80,870.91 | 19,129.09 | 202/01-සුනඛ එන්නත් ගමන් වියදම් | 50,000.00 |
| | | | | | 203/05-සුනඛ කරපටි හා එන්නත් පොත් | 50,000.00 |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2022 අගෝස්තු  මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.සී.කිත්සිරි පෙරේරා මහතා

විවාද

2022 අගෝස්තු  මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස 2022 අගෝස්තු මස 09 වන දිනය  තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී මණ්ඩලය  විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම  - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ටී.මහේන්ද්‍රන් මහතා
වතු ක්ෂේත්‍රයේ නියුතු කම්කරුවන් විශ්‍රාම යාමේදී වතු පාලක පක්ෂ මඟින් සේවක අර්ථ සාධක අරමුදල් ,සේවක භාරකාර අරමුදල් පාර්තෝෂිත දීමනා ඇතුළු වෙනත් ගෙවීම් නොගෙවන අවස්ථා වලදී වෘත්තීය සමිති මැදිහත් වී කම්කරු කාර්යාල හරහා ලබා දීමට කටයුතු කරනු ලබයි. එහිදි බොහෝ විට සේවකයාට හිමි සියළු දීමනා ගෙවීමට වතු කළමණාකාරිත්වය නියෝග කළද ඔවුන් විසින් එම දිමනා ගෙවීම ප්‍රමාද කරනු ලබයි. එබැවින් මෙම මුදල් හැකි ඉක්මණින් වතු කම්කරුවන්ට ලැබෙන සේ කටයුතු කරන මෙන් කම්කරු කාර්යාල වෙත ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

වතු ක්ෂේත්‍රයේ නියුතු කම්කරුවන් විශ්‍රාම යාමේදී වතු පාලක පක්ෂ මඟින් සේවක අර්ථ සාධක අරමුදල් ,සේවක භාරකාර අරමුදල් පාර්තෝෂිත දීමනා ඇතුළු වෙනත් ගෙවීම් නොගෙවන අවස්ථා වලදී වෘත්තීය සමිති මැදිහත් වී කම්කරු කාර්යාල හරහා ලබා දීමට කටයුතු කරනු ලබයි. එහිදි බොහෝ විට සේවකයාට හිමි සියළු දීමනා ගෙවීමට වතු කළමණාකාරිත්වය නියෝග කළද ඔවුන් විසින් එම දිමනා ගෙවීම ප්‍රමාද කරනු ලබයි. එබැවින් මෙම මුදල් හැකි ඉක්මණින් වතු කම්කරුවන්ට

ලැබෙන සේ කටයුතු කරන මෙන් කම්කරු කාර්යාල වෙත ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

සේවකයාට හිමි සියලු දීමනා ගෙවීමට වතු කළමණාකාරීත්වයට නියෝග කළද ඔවුන් විසින් එකී ගෙවීම් ප්‍රමාද කරනු ලබන බැවින් වතු ප්‍රජාව බොහෝ අපහසුතාවයට ලක් වී ඇති අතර මේ පිළිබඳව සොයා බලා සියලු ගෙවීම් අප්‍රමාදව ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාල ආයතන දැනුවත් කිරීම සුදුසු බවට ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා

වර්තමානයේ සාමාන්‍ය ජනතාවට ඇති ප්‍රශ්න වලට අමතරව සිල්ලර බඩු වෙළඳාම් කරන පිරිස් වැඩි මිලට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය විකුණනු ලබයි.තම දරුවන්ගේ කුසගිනි නිවීම පිණිස මිල කීයයැයි පැවසුවද පාරිභෝගිකයා පවත්වන අපහසුතාවය වළක්වා ගැනීම පිණිස ඔවුන් පවත්වන අපහසුතාවය පිළිබඳව පරිභෝගික සේවා අධිකාරිය වෙත දැනුම් දීමට කටයුතු කිරීම සඳහා මහජනතාව නිතර නිතර දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

වර්තමානයේ සාමාන්‍ය ජනතාවට ඇති ප්‍රශ්න වලට අමතරව සිල්ලර බඩු වෙළඳාම් කරන පිරිස් වැඩි මිලට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය විකුණනු ලබයි.තම දරුවන්ගේ කුසගිනි නිවීම පිණිස මිල කීයයැයි පැවසුවද පාරිභෝගිකයා පවත්වන අපහසුතාවය වළක්වා ගැනීම පිණිස ඔවුන් පවත්වන අපහසුතාවය පිළිබඳව පරිභෝගික සේවා අධිකාරිය වෙත දැනුම් දීමට කටයුතු කිරීම සඳහා මහජනතාව නිතර නිතර දැනුවත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ප්‍රජාවට සහන සැලසීම උදෙසා වෙළඳපොළ භාණ්ඩ මිල පාලනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර කඩිනමින් යොදා ගැනීම සුදුසු බවත් අලෙවිසැල් හිමියන්ට භාණ්ඩ මිල ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වර්තාව

2022.07.05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 ජූනි මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අසනීප නිවාඩු ලබා ඇති බැවින් 2022-07-12 වන දින සභාවට සහභාගී නොවීම සම්බන්ධයෙන් ගරු සභාව විසින් එකී සභිකයා වෙත අසනීප නිවාඩු ලබා දීම සුදුසු බවට එකඟතාවය පළ කරන ලදී.

**<u>08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.</u>**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් ග්‍රාම සේවා වසම් සඳහා ලබා දෙනු ලබන වීථි පහන් ලබා දීම කඩිනමින් සිදු කළ යුතු බවත් මේ වන විට අක්‍රියව පවතින වීථි පහන් අලුත්වැඩියා කිරීම සිදු කර දෙන ලෙසත් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉන්දික සම්පත් මහතා අදහස් දක්වමින් පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේ දී ඉවත් කරන ලද සෙවිලි තහඩු උමංකඳුර ප්‍රදේශයේ ජීවත් වන ප්‍රාදේශීය සභා සේවකයින්ගේ අබලන්ව පවතින සභාවට අයත් කම්කරු නිවාස සෙවිලි කර ගැනීම සඳහා ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් වර්තමාන ආර්ථික තත්ත්වය හමුවේ ප්‍රජාව විවිධ ආර්ථික ගැටලුවලට මුහුණ දී ඇති පසුබිමක පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කර නැවත සෑදීම සම්බන්ධයෙන් මේ වන විට සමාජයේ කතිකාවක් ඇතිව පවතින බවත් මිනිසුන්ගේ පවතින දුර්මතය දුරු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනුයේ ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියෙ හි ප්‍රතිපාදන යටතේ බවත් සඳහන් කරමින් දැන්වීම් පුවරුවක් ස්ථාපිත කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා අදහස් දක්වමින් රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාළව නිකුත්කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛ පරිදි වර්තමාන රටෙහි පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය සලකා බලා නැවත දැනුම් දෙන තුරු සංවර්ධන කාර්යයන් සඳහා වියදම් දැරීම සිදු කළ නොහැකි බැවින් මහජන නියෝජිතයන් ලෙස තම ප්‍රජාව වෙත සිදු විය යුතු අත්‍යවශම කාරණාවක් හෝ මහජන නියෝජිතයන් වෙත ඉටු කිරීමට නොහැකි බැවින් ද අත්‍යාවශ්‍යම අසරණ රෝගී පුද්ගලයෙකුට වෛද්‍ය ආධාර ලබාදීමක් හෝ ද්‍රව්‍ය ආධාරයක් ලබා දීම මගින් ප්‍රජාව වෙත සහන සැලසීම සිදු කළ නොහැකි වීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන බවත් සභා අරමුදල මගින් වාර්ෂිකව ඉටු කිරීමට යෝජනා කර ඇති සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සිදු කළ නොහැකි විම හේතුවෙන් මහජන නියෝජිතයන් ලෙස ඔවුන් මහත් අපහසුතාවයකට පත්වන බවත් පවතින ගැටලුකාරි තත්වය සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමන් දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

එසේම එරණවෙල සේවා පියසෙ හි වැසිකිළිය ඉදි කිරීම තාවකාලිකව නතර වී ඇති බවත් එකී කාර්යය පහසු කර ගැනීම සඳහා හැකි නම් සෙවිළි තහඩු ලබා දීම සිදු කරන්නේ නම් එය වැදගත් කටයුත්තක් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් වර්තමාන ආර්ථික අර්බුධකාරී තත්ත්වය හමුවේ ජනතාව පීඩාවට පත්ව සිටින මෙවැනි අවස්ථවක මනුසත් දෙරණ සමාජ මෙහෙවර යටතේ හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වියළි ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම සම්බන්ධයෙන් හපුතලේ ප්‍රාදේශීය සභා ගරු සභාපතිතුමන් ඇතුලු මන්ත්‍රී මණ්ඩලය විසින් මනුසත් දෙරණ, වැඩසටහන් අධ්‍යක්ෂ ඇතුලු දෙරණ ආයතනයෙ හි කාර්යය මණ්ඩලය වෙත කෘතඥතාවය පළ කරන අතර මෙවැනි කටයුතු සිදු කිරීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය නිරතුරුව ලැබේවා යන්න ප්‍රාර්ථනා කරන බව සඳහන් කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.